IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2014/2015

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2016 නොවැම්බර්)

## BLE 203 - සමාජ ගවේෂණ ක්‍රම

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගනන හතරකි (04)

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. අනිවාර්ය ප්‍රශ්නය

සමාජ ගවේෂණයක තිබිය යුතු මූලික පියවරයන් අනුගමනය කරමින් ඔබ විසින් ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජිත ව්‍යාපෘති වාර්තාවට අදාලව පර්යේෂණ යෝජනාවලියක් කෙටුම්පත් කරන්න.

(සැලකිය යුතුයි: මෙම පාඨමාලව තුළ ඔබ ඉදිරිපත් කරන ලද පර්යේෂණ මාතෘකාව ආශ්‍රයෙන් පමණක් මෙම යෝජනාව කෙටුම්පත් කළ යුතුය.)

(ලකුණු 40)

02. සමාජ ගවේෂණයක ප්‍රධාන අරමුණු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. i. සමාජ විද්‍යා ගවේෂණයේදී දත්ත රැස්කිරීම සිදුකරන ආකාර ලුහුඩින් විස්තර කරන්න.

ii. ඉහත සඳහන් කරන ලද එක්රැස් කිරීමේ ක්‍රමයන්හි ඇති වාසි හා අවාසි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න

(ලකුණු 20)

04. "සමාජ ගවේෂණයේදී සාහිත්‍ය විමර්ශනය ඉතා වැදගත් අංගයකි". මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

(ලකුණු 20)

05. i. සමාජ ගවේෂණය සඳහා විද්‍යාත්මක ක්‍රමවේදය භාවිතයේ ඇති වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

ii. විශ්වාසනීය වූ දැනුම (Reliable Knowledge) හා විශ්වාසනීය නොවූ දැනුම (Unreliable Knowledge) අතර වෙනස කුමක්දැයි කෙටියෙන් පැහිදිලි කරන්න.

iii. කිසියම් උපකල්පනයක් අනුසාරයෙන් ගොඩනැගුනු පුරෝකතනයක් පරීක්ෂා කිරීමේදී ලද ප්‍රතිඵල එම පුරෝකතනයට එරෙහිව පැන නැගුනු විට එම උපකල්පනය ප්‍රතික්ෂේප කිරීමට ලක්කලද, ප්‍රතිඵල පුරෝකතනයට එකගව පැන නැගුනු කල්හි වුවද එම උපකල්පනය පිලිගැනීමට ලක් නොවේ. ඉහත ප්‍රකාශය පැහැදිලි කර ඊට බලපාන හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. කම්කරු ආරවුලක් විසඳීම සම්බන්ධව නව ක්‍රියා පරිපාටියක් හඳුන්වා දී ඇති අතර ඒ සම්බන්ධව ප්‍රකාශ වූයේ, නව ක්‍රමය මගින් එක් කම්කරු ආරවුලක් අවම වශයෙන් දින 30 ක් වත් ඇතුළත විසදා ගත හැකි බවය. එහිදී දින දෙකක පමණ වෙනසක් ($\sigma = 2$) පැවතිය හැකි බවද සඳහන් වී තිබුණි. මෙම නව ක්‍රියාපටිපාටිය පිළිබඳ විමසිලිමත්වන කම්කරු සබඳතා පිළිබඳ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයන් විසින්, ඉහත අවම වශයෙන් දින 30 කදීවත් විසඳුමක් ලබාගත හැකිය යන ප්‍රකාශය පරික්ෂා කිරීම සඳහා 5% වෙසෙසිතාවයක් ($\alpha$=5%) යටතේ තනි නියැදි පරික්ෂාවක් සිදුකරන ලදී. ඒ සඳහා 144 ක් වූ සසම්භාවී නියැදියක් තෝරාගන්නා ලද අතර එහි මධ්‍යන්‍යය දින 29 ක් බැව් සොයාගන්නා ලදී. ඉහත ප්‍රකාශය ඉහත දත්ත ඇසුරින් 5% වෙසෙසිතාවයක් යටතේ පරික්ෂා කරන්න. (ගණනයට අදාල දත්ත වගු සපයා ඇත)

i. ඉහත පරික්ෂාවට අදාල සංගහනය කුමක්දැයි ලියා දක්වන්න.

ii. එම සංගහනයේ ව්‍යාප්තිය කුමන ආකාරයේ ව්‍යාප්තියක් ලෙස සලකා ඔබ මෙම ගණනය සිදු කරන්නේ දැයි අදහස් දක්වන්න.

iii. ඉහත ගණනයට අදාල සංඝනන පරාමිතීන් හා නියැදි සංඛ්‍යාතයන් ලියා දක්වන්න.

iv. ඉහත කල්පිත පරික්ෂාවට අදාල ශුන්‍ය කල්පිතය හා වෛකල්පිතය ලියා දක්වන්න.

v. කල්පිත පරික්ෂාව සිදුකර එහි ප්‍රධාන නිගමනය අනුව ශුන්‍ය කල්පිතය සම්බන්ධව කෙරෙන නිගමනය ලියා දක්වන්න.

(ලකුණු 20)